www.wsws.org ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඔබාමා ගුවන් යානා බෝම්බ කුමන්ත්‍රනය වසං කිරීමේ යෙදී සිටී

## The airplane bomb plot: Obama continues the cover up

පැට්‍රික් මාටින් විසිනි

2010 ජනවාරි 8

ඩෙට්‍රොයිට් නගරයට ඉහලින් පියාසර කරමින් තිබූ නෝර්ත් වෙස්ට් ගුවන් සේවාවේ යානයකට නත්තල් දින බෝම්බ ප්‍රහාරයක් එල්ල කිරීමට තැත් කිරීම පිලිබඳව ජනාධිපති බරක් ඔබාමා විසින් කරන ලද ප්‍රකාශය වනාහි, අසාර්ථකවූ එම ත්‍රස්තවාදී ප්‍රහාරය තෙක් දිව යන වකවානුව තුල එක්සත් ජනපද ඔත්තු සේවා හා ආරක්ෂක අංශවල කටයුතු, මාධ්‍යවල ද ආධරය හා සහභාගිත්වය ඇතිව වසං කිරීමෙහිලා ආන්ඩුව පුරා විහිද තිබෙන වැඩ සටහනක් ඉදිරියටත් පවත්වාගෙන යාමකි.

2001 සැප්තැම්බර් 11 ප්‍රහාරයෙන් අනතුරුව එවන් වසංකිරීම් සම්බන්ධයෙන් මන්ත්‍රනයක් බවට පත්ව තිබෙන "හිඩැස සම්බන්ධ කිරීමට අසමත්වීම" පිලිබඳ ප්‍රකාශය ඔබාමා පුනරුච්ඡාරනය කලේය. 9/11 න් අනතුරුව විවාදයට ලක්ව ඇති විශාලතම ආරක්ෂක බිඳවැටීම සනිටුහන් කල මෙම සිද්ධිය සම්බන්ධයෙන් කිසිදු බුද්ධි අංශ නිලධාරියෙකු කිසිදු ප්‍රශ්න කිරීමකට ලක් නොවන බවට ඔබාමා සහතික විය.

නෝර්ත් වෙස්ට් ගුවන් යානය ඩෙට්‍රොයිට් කරා පහත බසිද්දී තරුන නයිජීරියානු ජාතික උමාර් ෆාරුක් අබ්දුල්මුතාලෙබ් සිය යට ඇඳුම්වලට මසා තිබූ ප්ලාස්ටික් පුපුරන ද්‍රව්‍ය ගිනිගැන්වීමට උත්සාහකර අසාර්ථකවීමෙන් පසුව පැලපදියම් කරනලද රටාව, ජනාධිපති සිය ප්‍රාකාශ තුලින් පෙරට ගෙන යයි.

ගුවන් ගමනට මාසයකටත් පෙරාතුව අබ්දුල්මුතාලෙබ්ගේ පියා නයිජීරියාවේ එක්සත් ජනපද තානාපති කාර්යාලයට පැමිනීම ඇතුලුව, තොරතුරු රැසක් එරට සතුව තිබිය දී, ඇමරිකාව බලා පියාසර කරන යානයකට ගොඩවීමට මුතාලෙබ්ට හැකිවූයේ කෙසේ ද යන්න ගැන ගැලපෙන හෝ විශ්වාසනීය පැහැදිලි කිරීමක් සිද්ධියන් පසුව ගෙවී ගිය දෙසතිය තුලම ඉදිරිපත් වී නැත.

මුතාලේබ් තර්ජනයක් විය හැකි පුද්ගලයෙකු ලෙස හඳුනාගෙන ඔහු ගුවන් ටිකට් පතක් ලබාගත නොහැකි අයගේ ලැයිස්තුවට ඇතුලු කිරීමට තරම් ප්‍රමානවත් තොරතුරු එක්සත් ජනපද බුද්ධි අංශ සතුව තිබුනු බව ඔබාමා පිලිගත්තේය. තොරතුරු රැස්කිරීමේ අඩුපාඩුවක් සිදු නොවූ බවත් ඒ වෙනුවට සිදුවූයේ විසිර තිබූ තොරතුරු සම්බන්ධ කිරීමේ අසාර්ථකත්වයක් බවත් ඔහු යලි යලිත් කියා සිටියේය. එහි ප්‍රතිපලය වූයේ "හොඳින් දන්නා ත්‍රස්තවාදියෙකුට" ඇම්ස්ටර්ඩෑමයෙන් ගුවන්ගතවීමට ඉඩ සැලසීමය.

ඉන් පසුව සිදු වූයේ තනි පුද්ගලයෙකු අතින් හෝ තනි අංශයක් අතින් වරදක් සිදුව නැති බව ප්‍රකාශකිරීමයි. එහි අර්ථය නම්, මේ සිද්ධියට සම්බන්ධ සියල්ලෝ ම වගකීමෙන් මුදාලන බව ප්‍රසිද්ධියේ කියා සිටීමයි. පියවරක් ගැනීමේදී ගැටලුව වූයේ, අංශ අතර සම්බන්ධීකරනය නිසා එය ඕනෑකමින්ම කරන ලද නොමඟයවන සුලු ප්‍රකාශයක් ද වේ.

එහෙත් ඔබාමාගේ ප්‍රකාශය කරන ලද දිනවල, තව දුරටත් රහස්‍ය නොවන ආකාරයකින් නිකුත් කරන ලද සිද්ධියේ පරිපාලන සමාලෝචනයක සම්පින්ඩනය, මේ ගම්‍යයට පරස්පර වෙයි. මධ්‍යම බුද්ධි අංශය හෙවත් සීඅයිඒ හා ත්‍රස්තවාදයට එරෙහි ජාතික මධ්‍යස්ථානය (එන්සීටීසී) යන ආයතන දෙකමට ම, එකිනෙකින් වෙන්ව හා ස්වධීනව, මුතාලෙබ් අඳුනාගැනීමට අවශ්‍ය සියලු තොරතුරු ලැබී තිබුනු බව මේ සම්පින්ඩනය අනාවරනය කරයි.

සම්පින්ඩනයට අනුව, සම්බන්ධකල යුතුව තිබූ ප්‍රධානතම "හිඩැස් හෙවත් කරුනු නම්, 1. ආරාබි අර්ධද්වීපයේ අල් කයිඩා සංවිධානය විසින්, එක්සත් ජනපදයට ප්‍රහාරයක් එල්ල කිරීමට සැලසුම් කිරීම, 2. ඒ සඳහා එම සංවිධානය විසින් නයිජීරියානු ජාතිකයෙකු බඳවාගැනීම, 3. අන්තවාදී සංවිධානයකට බැඳීම සඳහා මුතාලෙබ් යේමනය බලා පිටත්ව යාම" යනාදියයි. "ප්‍රහාරය එල්ල කිරීමේ ප්‍රයත්නයට පෙරාතුව, සීඅයිඒ හා එන්ටීසීටී යන සංවිධානයන්හි මූලාශ්‍ර විශ්ලේෂකයන් සතුව ඒ පිලිබඳ සියලු තොරතුරු තිබුනේ" යයි ලියවිල්ලෙහි සඳහන්වේ.

මතුපිටින් පෙනීයන ආකාරයට මින් ඇඟවෙන්නේ, ආරක්ෂක කටයුතුවල 2009 දෙසැම්බර් 25 සිදුවූ අඩුපාඩුව සැප්තැම්බර් 11 කඩාවැටීම ඉක්මවා යන්නක් බවය. 9/11 ප්‍රහාර නතර කිරීමට අසමත්වීම පිලිබඳ නිල පැහැදිලි කිරීම වූයේ, ත්‍රස්තවාදීන් ගුවන් යානා පැහැරගත් බව අනාවරනය කරගැනීමට හා ඒවා වැලැක්වීමට කල්තියා පියවර ගැනීමට අවශ්‍ය තොරතුරු වලින් කොටසක් සීඅයිඒ, එෆ්බීඅයි වැනි සංවිධාන හා අනෙකුත් ආරක්ෂක අංශ සතුව තිබුන නමුත්, නිලධාරිවාදී බල අරගල හා මෙම සංවිධාන එකිනෙකින් වෙන්කෙරෙන "තාප්ප" හරහා තොරතුරු හුවමාරුකර ගැනීම ප්‍රතික්ෂේප කිරීම හමුවේ කාලානුරූපව අවශ්‍ය අඳුනාගැනීම් හා සම්බන්ධීකරන ක්‍රියාමාර්ග ගැනීම වැලකී ගිය බවයි.

9/11 සිද්ධි පිලිබඳ මේ නිල වසංකිරීමේ වෘත්තාන්තයට එරෙහිව *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* පුලුල් වශයෙන් ලියා ඇත. එහෙත් නත්තල් දින බෝම්බකරු නොර්ත් වෙස්ට් ගුවන් යානයට ගොඩවීම වැලැක්වීමට අසමත්වීම පිලිබඳව දැන් ඉදිරිපත් කෙරෙන පැහැදිලිකිරීම් හා සසඳ බලන විට (නිවැරදි නොවන නමුත්) එම වෘත්තාන්තය හරි බවක් පෙනී යයි. ඔබාමාගේ ම වාර්තාවට අනුව, ආන්ඩුවේ ආයතන දෙකක් එනම්, සීඅයිඒ හා එන්සීටීසී සතුව බෝම්බකරු හඳුනාගැනීමට අවශ්‍ය සියලු තොරතුරු තිබුනි. එහෙත් මෙම ආයතන දෙකම, තම තමන්ගේ අභිමතය පරිදි ක්‍රියාකරමින් බෝම්බකරු හඳුනා නොගත්හ. එක සමානවූ මේ අසාර්ථකත්වයන් දෙකම සිදුවූයේ, එන්සීටීසී 9/11 සිද්ධියට පසුව ස්ථාපිත කරන ලද්දේ සමස්ත එක්සත් ජනපද බුද්ධි යාන්ත්‍රනයේම කේන්ද්‍රීය "හිඩැස් සම්බන්ධ කරන්නා" ලෙස කටයුතු කිරීමේ අරමුන සඳහා යයි කියා තිබියදී ම ය.

තව ද අප කලින් සඳහන් කල පරිදි, "හිඩැස් සම්බන්ධකිරීම" යන රූපකයෙන් ඇඟවෙන්නේ, තොරතුරු ගොන්නක් තුල එක් එක් දත්ත වෙන් වෙන්ව ගත් කල අපරාධයක් කිරීමේ අරමුනක් ප්‍රකාශිත නොවන අතර, ඒ තුල කා වැදුනු කුට රටාවන් අධීක්ෂනය කල හැක්කේ තොරතුරු සියල්ල තමන් සතුව ඇති අයෙකුට පමනක්ය යන්නය. එහෙත් නත්තල් දින බෝම්බ ප්‍රයත්නයේදී එක් එක් ප්‍රධාන දත්තය අනතුරු අඟවන සංඥාවක් විය. සීඅයිඒ හා එන්සීටීසී කල පරිදි මෙම අනතුරු ඇඟවීම නොසලකා හැරීමෙන් ආගවෙන්නේ හුදු අදක්ෂකම පමනක් නොව, දැනුවත් ලෙස සිතා මතාම අක්‍රියවීමකි.

ඔබාමා ප්‍රකාශයේ තවත් සටහන්කර ගත යුතු පැත්තක් තිබේ. දේශපාලන අවශ්‍යතාවක් ලෙස පෙනී යන ඕනෑම පුද්ගලත්වයකට අනුගත වීමේ මනා පරිචයක් ඔහු සතුව ඇත. මේ කාරනයට අදාලව ගත් කල එය "සේනාධිනායකයාට" ගැලපෙන අරමුනක් සහිත, අධිෂ්ඨානය සහිත ඉරියව්වක පිහිටා ගැනීමය. "වගකීම අවසන් වන්නේ මෙතැනය" වැනි සුලභ වාක්‍ය යොදාගෙන ඔහු කථා කලේ කෙටි ප්‍රකාශිත වැකි තුලිනි. ප්‍රශ්න ඇසීමට අවකාශයක් නොදුන් ඔහු, මාධ්‍යයට තතු පහදාදීමේ කාර්යය ඉහල පෙලේ ආරක්ෂක නිලධාරීන් දෙදෙනෙකු වන ධවල මන්දිර ත්‍රස්තවාදී උපදේශක ජෝන් බ්‍රෙනන්ට හා නිජබිම ආරක්ෂක ලේකම් ජැනට් නැපොලිටන්ට භාර කලේය.

ඔවුන්ගේ පුවත්පත් සාකච්ඡාව කෙටි එකක් විය. ඒ සඳහා ගතවූයේ විනාඩි 14 කටත් අඩු කාලයකි. ඇම්ස්ටර්ඩෑම්හිදී අබ්දුල්මුතාලෙබ් ගුවන් යානයට ගොඩවීමට පෙරාතුව එක්සත් ජනපද ආරක්ෂක අංශ දැනසිටි දේ ගැන විස්තරයකින් බ්‍රෙනන් සාකච්ඡාව ඇරඹීය. විමසීමට ලක් විය යුතු ප්‍රශ්න තිබුනේවී නමුත් නිල වසංකිරීමේ කථාවට කිසිදු බරපතල අභියෝගයක් එල්ල නොවීය.

බ්‍රෙනන් මෙසේ කරුනු දැක්වීය. "නත්තල් දින ප්‍රහාරය කරා ගමන්ගත් සති හා මාස කිහිපය තුල අරාබි අර්ධද්වීපයේ අල් කයිඩා සංවිධානය (ඒකිව්ඒපී) විසින් එල්ල කෙරෙන මූලෝපායික තර්ජනය හා උමාර් ෆාරුක් අබ්දුල්මුතාලෙබ්ගේ නිශ්චිත කුමන්ත්‍රනය පිලිබඳ තොරතුරු බිඳක් අප බුද්ධි ප්‍රජාවේ විවිධ අංශ සතුව තිබුනි. 2008 වසරේ සනාඃ හි අප තානාපති කාර්යාලයට ප්‍රහාර එල්ලවූ අවස්ථාවේ කලාක් මෙන් ඒකිව්ඒපී යේමනයේ එක්සත් ජනපද ඉලක්කවලට පහරදීමට උත්සාහ කරන බව හොඳින් දැන සිටි කරුනක් විය. නොවැම්බරයේදී ඔහුගේ පියාගේ අනතුරු ඇඟවීම්වලට ස්තුති වන්නට මුතාලෙබ් අන්තවාදී අදහස් වැලඳගෙන තිබූ බවත් ඔහු හඳුනා නොගත් අන්තවාදීන් හා එක්ව ඇති බවටත් ඔහුගේ පියා තුල බියක් පැවති බවත් හොඳින්ම දැන සිටි කරුනකි.

යේමනයෙහි අල් කයිඩා වෙතින් එල්ලවූ තර්ජනය හා මුතාලෙබ්ගේ අන්තවාදී සබඳතා මෙන්ම ඔහු කලක් එරට ගතකිරීම යන කරුනු එකට එකතු කර ගනීමට දැවැන්ත එක්සත් ජනපද බුද්ධි හා ආරක්ෂක යාන්ත්‍රනය අසමත්වී යයි කිසිදු පැහැදිලි කරුනු දැක්වීමකින් තොරව බ්‍රෙනන් තව දුරටත් කියා සිටියේය.

යානය ගුවන්ගතව තිබෙන අතරතුර මගී ලැයිස්තුව පරීක්ෂා කරමින් සිටිය දී ඩෙට්‍රොයිට් රේගු නිලධාරීන් ටයිඩ් නමැති ලේඛනයෙහි (මෙය ගුවන් ගමනෙහි යෙදීමට අවසර නැති මගී ලැයිස්තුවට වඩා විශාල දත්ත එකතුවකි) මුතාලෙබ්ගේ නම දැක ඇති බවට *ලොස් ඇන්ජලීස් ටයිම්ස්* පත්‍රයේ පලවූ වාර්තාවක් ගැන නැපොලිටන්ගෙන් ප්‍රශ්න කරන ලදී. ගුවන් යානය ගොඩ බැස්සවීමෙන් අනතුරුව රේගුව ඔහුගෙන් ප්‍රශ්න කිරීමට අදහස්කර සිටි බව ඇය සනාථ කල නමුදු ආරක්ෂක පියවර ගැනීමට හැකිවන පරිදි යානයේ නිලධාරීන්ට එය දැනුම් නොදුන්නේ මන්ද යන්න පිලිබඳව පැහැදිලි කිරීමට ඇය අසමත් වූවාය.

දෙසැම්බර් 25 සිද්ධීන් ඒ ආකාරයට දිග හැරුනේ මන් ද හා කෙසේ ද යන්නට පිලිතුරක් දීමට මෙතෙක් හැකියාවක් ලැබී නැත. එහෙත් එක කරුනක් නිශ්චිතය. නිල කථාන්තරය ඇදහිය නොහැක්කකි. ඔබාමා පාලනාධිකාරය හා එක්සත් ජනපද බුද්ධි අංශ ඇමරිකානු ජනතාවට සත්‍යය නොකියති.

විය හැකි එක් දෙයක් වන්නේ, අබ්දුල්මුතාලෙබ් අල්කයිඩා අනුගාමිකයෙක් ලෙස හඳුනාගෙන තිබුනු නමුත් විශේෂයෙන්ම ඔහුගේ පවුල් සම්බන්ධතා සැලකිල්ලට ගත් කල දැකගනු ලැබුවේ, ඇමරිකානු ඒජන්තයෙකු ලෙස බඳවාගැනීමට හැකියාව තිබූ පුද්ගලයෙකු ලෙසය. ඒ පසුගිය සතියේදී අෆ්ගනිස්ථානයේදී සීඅයිඒ නියෝජිතයන්ට විනාශය කැඳවූ මෙහෙයුමේ රටාව අනුවය. (එම සිද්ධියේදී බඳවාගන්නා ලදැයි කියනු ලබන එම පුද්ගලයා සීඅයිඒ ඒජන්තයන් සත් දෙනෙකුට මරු කැඳවූ මරාගෙන මැරෙන බෝම්බකරුවෙකු බවට පත් විය. අංක 253 ගුවන් ගමනේදී බෝම්බය පුපුරා ගියේ නම් මරන සංඛ්‍යාව 300 කට ආසන්න වනු ඇත.)

ඔබාමා පාලන තන්ත්‍රය අස්ථාවර කර දුර්වල කිරීම සඳහා බුද්ධි අංශ තුල දැරුනු ප්‍රයත්නයක් ද ඇතුලුව, වෙනත් සම්භාව්‍යතා ද තිබුනි. මැද පෙරදිග හා මධ්‍යම ආසියාවේ වඩාත් ආක්‍රමනකාරී මිලිටරි මැදිහත්වීම් වලට ඔබාමා පාලන තන්ත්‍රය තල්ලු කිරීමේ මාධ්‍යයන් සපයා ගැනීම ද එකකි.

මේ සන්දර්භය තුල විධායක නියෝගයක් නිකුත් කිරීමට හා එය ප්‍රසිද්ධියට පත්කිරීමට ඔබාමාට බලකෙරුනු අපූරු පරිසිද්ධිය යමෙක් සැලකිල්ලට ගත යුතුය. එම නියෝගය මගින් "බුද්ධි විශ්ලේෂන ශිල්පයේ දැඩිබව දියුනු තියුනු කිරීමටත්, ප්‍රමිතීන් ඉහල නැංවීමටත් - විශේෂයෙන්ම ත්‍රස්තවාදී කුමන්ත්‍රන අනාවරනය කර ගැනීමට හා වැලැක්වීමට සකසන ලද - එක්සත් ජනපදයේ "ත්‍රස්තවාදයට එරෙහි ප්‍රජාවට බල කෙරිනි."

9/11 සිද්ධියෙන් අට වසරකට පසුව එවැනි නියෝගයක් පැනවීම අසාමාන්‍ය සිදුවීමකි. එහෙත් ධවල මන්දිර විධායක සම්පින්ඩනයේ අවසන් ඡෙදයක මෙසේ සඳහන් වෙයි.

"විශේෂයෙන් එක්සත් ජනපද නිජභූමියේ ආරක්ෂාවට එරෙහිව අල් කයිඩා සංවිධානය හා එහි මිත්‍රයන් විසින් කරගෙන යන ඉතා පැහැදිලි හා ප්‍රමුඛත්වයක් දරන කුමන්ත්‍රන ප්‍රයත්නයන්ට සම්බන්ධ සියලු හෝඩුවාවන් පසුපස හඹා යැම සඳහා දෙපර්තමේන්තු හා නියෝජිත ආයතන වගකිවයුතු බවට පත් කෙරෙන පරිදි, ත්‍රස්තවාදී තර්ජන වාර්තා කිරීම හා ඒ පිලිබඳව ගන්නා ලද ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් පරිපූර්න හෝ සක්‍රීය ක්‍රියාවලියක් නොතිබුනි."

වාක්‍ය වින්‍යාසය දඟරගැසී ඇති අතර භාෂාව අපැහැදිලි නමුදු පැමිනිය හැකි එකම බැරෑරුම් නිගමනය නම් "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය" ව්‍යාජයක් බවයි. එය විදේශයන්හි එක්සත් ජනපද මිලිටරි ආක්‍රමනය තීව්‍ර කිරීම සඳහාත් රට අභ්‍යන්තරයේ ඇමරිකානු ජනතාවගේ ප්‍රජාතන්ත්‍රීය අයිතීන් තලා දැමීම සඳහාත් යොදාගන්නා ව්‍යාජයකි.

© www.wsws.org